# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1693/15 – 2011 පෙබරවාරි 15 වැනි අඟහරුවාදා – 2011.02.15

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/32/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක මයා, අංක 318/3, උස්ගල, සියඹලාන්ගමුව, ගල්ගමුව.

සහ

මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම, නො. 260/20, බේස්ලයින් පාර, කොළඹ 09.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

කොළඹ 06, ඩබ්. ඒ. සිල්වා මාවත, නො. 181/1 - 503 හි ටී. ඊ. ශාන්තරාජන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/22/32/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක මයා, අංක 318/3, උස්ගල, සියඹලාන්ගමුව, ගල්ගමුව.

සහ

මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම, නො. 260/20, බේස්ලයින් පාර, කොළඹ 09.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම යටතේ පාලනය වූ නිරාවිය ගොවිපලට අනුයුක්තව අනියම් රියදුරකු වශයෙන් සේවය කරමින් සිටියදී 2005.10.03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනම් කරනු ලැබූ ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක මහතාට නැවත රැකියාව ලබා නොදීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නොවන්නේ නම්, ඔහුට කුමන සහනයක් ලැබිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 ජනවාරි මස 21 දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

03 - 131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.